# 7. උත්ථානයේ සුපුවත

**දෙවි සැලැස්මට අනුගත වෙමින් අපගේ පාපය වෙනුවෙන් ජේසුස් වහන්සේ බොහෝ වද වේදනා විඳ කුරුසිය මත තම ජීවිතය පූජා කළ ආකාරය පසුගිය පාඩමෙන් අපි විමසා බැලීමු. ජේසුස් වහන්සේ අපගේ ජීවමාන දෙවිඳුන් වන සේක. ඒ උන්වහන්සේ මලවුන් කෙරෙන් උත්ථාන වූ නිසා ය. මෙම පාඩමෙන් අප විමසා බලනු ලබන්නේ ජේසුස් වහන්සේ මලවුන්ගෙන් උත්ථාන වූ සුපුවත යි.**

ජේසුස් වහන්සේ කුරුසි පත් කිරීමෙන් පසු ව එළඹි සබත් දිනය නිම වී සතියේ පළමු වන දා එළිවෙන මොහොතේ කාන්තාවන් සොහොන වෙත ගියෝ ය. එසේ ගියේ එකළ පැවති සිරිතට අනුව උන්වහන්සේගේ මෘත ශරීරය සුවඳ ද්‍රව්‍යයෙන් ආලේප කිරීමට ය. නමුත් එම ස්ථානයට ගිය මොහොතේ සිදු වූයේ ඔවුන් කිසිසේත් බලාපොරොත්තු නොවූවකි.

මග්දලායේ මරියා: මේ මොකද වෙන්නේ ?. . . . මට නම් මහ බයක් දැනෙනවා.

මරියා: භූමි කම්පාවක් වගෙයි. ආ . . . අර දේව දූතයෙක් නේද සොහොන් ගෙය මත තිබූ ගල ඉවතට පෙරලා ඒ මත ඉඳගත්තේ ?

මග්දලායේ මරියා: මට නම් කිසි දෙයක් පේන්නේ නැහැ. ලොකු ආලෝකයකින් මගේ ඇස් වැහිලා වගෙයි.


මරියා: මට නම් පේන්නේ දේව දූතයෙක් වගෙයි. ඔහුගේ පෙනීම විදුලියක් වගෙයි. වස්ත්‍ර හිම මෙන් සුදු පාටයි.

මග්දලායේ මරියා: අර බලන්න . . . අපි වගේ ම රැකවල් කරන අයත් බයේ ඉන්නවා.

| | |
|---|---|
| දේවදූතයා: | "බය නොවන්න" මක්නිසාද කුරුසියේ ඇණ ගසන ලද ජේසුස් වහන්සේ ඔබ සොයන බව මම දනිමි. උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙස ම නැගිටුණු සේක. එන්න . . . . උන්වහන්සේ තැන්පත් කල ස්ථානය දෙස බලන්න. |
| මග්දලායේ මරියා: | මොනවා? උන්වහන්සේ මෙහි නැහැ? උන්වහන්සේ නැවත නැගිට්ටා ? |
| දේව දූතයා: | ඔව්, උන්වහන්සේ පෙර වදාළ ලෙස ම නැවත නැගිටුණු සේක. ඔබ දැන්ම ගොස් මෙම සුපුවත ශ්‍රාවකයන්ට දැනුම් දෙන්න. උන්වහන්සේ නුඹලාට පළමුවෙන් ගලීලයට යන සේක. එහි දී උන්වහන්සේ දකින්නාහු ය. |
| මග්දලායේ මරියා: | අපි ඉක්මණින් යමු. ගොස් මේ ශුභාරංචිය ශ්‍රාවකයන්ට කියමු. |
| මරියා: | ඔව් . . ඔව්... මට නම් මේක මහා පුදුම අත්දැකීමක්. අපි ඇසූ දුටු දේ ශ්‍රාවකයන්ට කියමු. |

මෙම සිදුවීම අත්දුටු කාන්තාවෝ මහත් බියෙන් හා ප්‍රීතියෙන් උන්වහන්සේගේ උත්ථානයේ ජයග්‍රාහී සුපුවත දන්වන පිණිස ශ්‍රාවකයන් වෙත දිව්වෝ ය. ඒ යන අතරතුර;

| | |
|---|---|
| ජේසුස් වහන්සේ: | "සුභ සිද්ධ වේවා! |
| කාන්තාවන් දෙදෙනා | :මොනවා මේ අපේ ජේසුස් වහන්සේ නේද? හරි පුදුමයි. |
| මග්දලායේ මරියා: | එන්න . . එන්න . . . අපි උන්වහන්සේට නමස්කාර කරමු. |
| ජේසුස් වහන්සේ: | බය නොවන්න. මාගේ සහෝදරයන් ළඟට ගොස් ඔවුන්ට ගලීලයට පිටත් ව යන්න කියන්න. එහි දී ඔවුන් මා දකිනවා ඇත. |




ජේසුස් වහන්සේගේ කුරුසි පත්වීම නිසා සියළු බලාපොරොත්තු සුන් ව අධෛර්යයට පත් ව දුක් මුසු ව සිටි සැමගේ ජීවිතවලට උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථානය වීම නව බලාපොරොත්තුවේ සුපුවතක් විය.

මුලින්ම එම ජයග්‍රාහී සාක්ෂිය සියැසින් ම දුටු කාන්තාවෝ එම පුනරුජ්ජීවනයේ සුපුවත දේව දූතයා පැවසූ ලෙස ම ශ්‍රාවකයන් වෙත ගෙන ගියෝ ය.

ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය අත්දුටු කාන්තාවන් ජයග්‍රාහී සුපුවතෙහි මුල් ම සාක්ෂිකරුවන් විය.

**මෙලෙස ස්ත්‍රීන් විසින් දන්වන ලද
ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ සුපුවත තුළින්
ශ්‍රාවකයන්ගේ ජීවිත ආලෝකවත් විය.**

**ඒ කෙසේද ?**

ජුදෙව් ජනතාව, රෝම අධිරාජ්‍යයේ පීඩනයට මෙන්ම වරප්‍රසාද ලත් පරිසි සද්දුසි, විනයධර වැනි තමන්ගේ ම ජුදෙව් ප්‍රභූවරුන්ගේ ආධිපත්‍යය යටතේ ද බොහෝ සේ පීඩාවට පත් ව සිටිය හ. මෙම පීඩාවලින් ඔවුන් මුදවා ගැනීම සඳහා පෙර දිවැසිවරු පැවසූ ලෙස ගැළවුම්කරුවකු හෙවත් මෙසියස් වහන්සේගේ ලොව පහළ වීම පිළිබඳ අපේක්ෂාවෙන් ඔවුහු බලා සිටිය හ.

මේ අනුව ජේසුස් වහන්සේ වනාහි තමන් මුදවා ගැනීමට පැමිණි මෙසියස් වහන්සේ ලෙස ඔවුහු විශ්වාස කළෝ ය. ඒ බව ජේසුස් වහන්සේ තේජශ්‍රීයෙන් ජෙරුසලම් දේව මාලිගාව වෙත යාමේ සිද්ධියේ දී ජනතාව ක්‍රියා කළ ආකාරයෙන් මනාව පැහැදිලි වේ.

නමුත් ජුදෙව් ජනතාව බලාපොරොත්තු නොවූ ලෙස ජේසුස් වහන්සේ මිහි පිට තම මෙහෙවර නිමකොට බොහෝ දුක් වේදනා විඳ කුරුසියේ තම ජීවිතය පූජා කළ සේක. මෙම සිදුවීම් ජේසුස් වහන්සේ ගේ ශ්‍රාවකයන් මෙන් ම ජුදෙව් ජනතාවගේ ද සියළු බලාපොරොත්තු බිඳ වැටීමටත් කණස්සල්ලටත් හේතු විය.

නමුත් සොහොන් ගෙය වෙත ගිය කාන්තාවන් ලද සුපුවත වූයේ,"**ජේසුස් වහන්සේ සැබවින් ම උත්ථාන වූ සේක**"යන්න ය. මෙම පුවත ශ්‍රාවකයන්ගේ ජීවිතවලට මහත් ප්‍රීතියක්, නව පන්නරයක්, නව බලාපොරොත්තු මෙන් ම නව ආලෝකයක් ඇති කරවන්නක් විය. එයින් ශ්‍රාවක පිරිසගේ ජීවිත ප්‍රබෝධමත් විය.

**එදා**

**ශ්‍රාවකයන්,**

**ස්ත්‍රීන් විසින් පවසන ලද**
**"ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය"**
**පිළිබඳ ජයග්‍රාහී සුපුවත ලැබීමෙන් පසු ක්‍රියා**
**කළේ කෙසේ ද?**

ජේසුස් වහන්සේගේ කුරුසි පත් වීමෙන් පසු ශ්‍රාවකයන් පෙර හුරු පුරුදු ජීවන රටාව වෙත යොමු වීමට පියවර ගත්හ. එහෙත් උත්ථානයේ පණිවුඩයත් සමග ශ්‍රාවකයන් නැවත ජේසුස් වහන්සේගේ "**ජීවමාන හඬ**" බවට පත්විය. ජේසුස් වහන්සේ සමග එකට ජීවත් වීමෙන් ඔවුන් අත්දුටු උන්වහන්සේගේ මහත් කැපවීමේ හා වැයවීමේ ජීවිතය ආදර්ශයට ගෙන ක්‍රියා කරන්නට උත්සුක විය. "ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් අපට උරුම වන සදාතන ජීවිතය" පිළිබඳ සාක්ෂි දැරීමට ශ්‍රාවකයන් දිරිමත් විය. එඩිතර විය. ඒ වෙනුවෙන් තම ජීවිත පරදුවට තැබීමට වුව ද ඔවුහු පසුබට නොවූ හ.

අද

අපට ද

**ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය**
**තුළින් නව බලාපොරොත්තුවක්**
**ලැබී ඇත.**

**එනම්**

**ජේසුස් වහන්සේ අප වෙනුවෙන් සිදු කළා වූ ජීවිත පූජාව කරණකොට ගෙන අපගේ පාපයට කමාව ලබාගත හැකි ය.**

**ජේසුස් වහන්සේගේ උත්ථානය තුළින් සදාකාල ජීවනයේ මාර්ගයට උරුමය අපට ලබා ගත හැකි ය.**

දෙව් දූතුන් මගින් ගෙනෙන ලද
ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනයේ සුපුවත
මුලින්ම ලද්දේ ස්ත්‍රීන් විසිනි.
ඔවුහු එම ජයග්‍රාහී පණිවුඩය ශ්‍රාවකයන් වෙත ගෙන ගිය හ.
එවිට
ශ්‍රාවකයන් ජේසුස් වහන්සේගේ හඬ බවට පත් වී
ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනයේ සුපුවතේ හි
සාක්ෂි කරුවන් බවට පත් වීම නිසා
අද අප එම බලාපොරොත්තුව තුළ ජීවත් වන
කිතුනුවන් බවට පත් ව සිටින්නාහු ය.
ඒ අනුව
එදා පුනරුජ්ජීවනය පිළිබඳ සුපුවත ගෙන ආ
කාන්තාවන් හා ශ්‍රාවකයන් කළ පරිදි අප ද
කිතුනු සුභාරංචිය හෙවත්
ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනයේ සත්‍ය සුපුවත
අන් අය වෙත ගෙන යා යුතු ව ඇත.

ජේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ ජයග්‍රාහී සුපුවතට සාක්ෂි දැරීමට ඔබගේ ජීවිත කෙසේ විය යුතු ද?

**කියවා බලමු**
**ශු. ලූක් 10:27**
**ශු. ජොහාන් 13:34**
**ශු. ජොහාන් 13:35**
**ශු. මතෙව් 5:14**

**කටපාඩම් කරමු.**
**ශු. මතෙව් 28: 19**

ක්‍රියාකාරකම

1. සොහොන වෙත ගිය කාන්තාවන්ට නැවත නැගිටි ජේසුස් වහන්සේ පිළිබඳ ව ලද සුපුවත කුමක් ද?

2. ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් අපට ලැබී ඇති විශේෂ වරප්‍රසාදය ලියන්න.